# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

සංචාරක අමාත්‍යාංශය

SRI LANKA CONVENTION BUREAU

TVEC

SLAPCEO

**සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධන සඳහා අධ්‍යාපනය හා පුහුණුව ලබාදෙන රටේ ප්‍රමුඛ රාජ්‍ය ආයතනය අපි වෙමු.**

## සිද්ධි කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව

මෙම පාඨමාලාව MICE Tourism ක්ෂේත්‍රය සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) ප්‍රථම වරට MICE සංචාරක ක්ෂේත්‍රයේ හවුල්කරුවෙකු වීමට බලාපොරොත්තුවෙන් සිටින අයවලුන් හට මෙමගින් විශේෂ අවස්ථාවක් නිර්මාණය කර දී තිබේ.

**ඇතුලත්වීමේ සුදුසුකම් :**

ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඒ හා සමාන විභාගයක් සමත්වී තිබීම හෝ

සිද්ධි කළමනාකරණ සමාගමක හෝ MICE සංචාරක ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද සමග ඉංග්‍රීසි භාෂා හැකියාව.

**පාඨමාලා කාලසීමාව** : මාස 06

**පාඨමාලා ගාස්තුව** : රු. 35,000/- (වාරික 02 කින් ගෙවිය හැකියි)

**පාඨමාලා අන්තර්ගතය :**

| සිද්ධි කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාවේ ඒකක |
|---|
| සංචාරක කර්මාන්තය පිළිබඳ හැඳින්වීම |
| සිද්ධි කළමනාකරණ මූලධර්ම |
| සිද්ධි අභිමතාර්ථ, අරමුණු |
| සිද්ධි සැලසුම්කරණ ක්‍රියාවලිය |
| සිද්ධි සඳහා ආරක්ෂක වැඩපිළිවෙල |
| සිද්ධි සංකල්පය සහ නිර්මාණය |
| මූලික සිද්ධි ශිල්පීකරණය සහ මූල්‍යකරණය |
| සිද්ධි කළමනාකරණය සඳහා ඉංග්‍රීසි භාෂාව |
| සිද්ධි කළමනාකරණය සඳහා තොරතුරු, සන්නිවේදන තාක්ෂණය |

මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කොළඹ ප්‍රධාන ශාඛාවේදී පැවැත්වේ. මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ සිසුන්ට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ හා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරන 04 වන මට්ටමේ ප්‍රවිනතා සහතිකයක් ද පිරිනමනු ලැබේ.

## කඳු නැගීම් හා මංපෙත් සංචරණය පිළිබඳ උපදේශක සහතික පත්‍ර පාඨමාලාව

මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ ත්‍රාසජනක සංචාරක උප ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා සහාය වීමට විශේෂයෙන් නිර්මාණය කර ඇත. මෙමගින් ත්‍රාසජනක සංචාරක කර්මාන්තයේ වෘත්තිමය කඳුනැගීම් උපදේශකවරයෙක් වීමට බලාපොරොත්තුවෙන් සිටින අයවලුන් හට අවස්ථාව විවරවීමක් වේ. රැකියා පුහුණු කාල සීමාව (OJT) ඇතුළුව උපරිම වසරක කාලයක් තුළ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීමෙන් ඔවුන්ගේ වෘත්තීය ජීවිතයේ මුල් අඩිතාලම හා නිපුණතා මට්ටම් වර්ධනය කිරීම මෙම වැඩසටහන මගින් බලාපොරොත්තු වේ.

**ඇතුලත්වීමේ සුදුසුකම් :**

ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සමාර්ථයක් සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඒ හා සමාන විභාගයක් සමත්වී තිබීම හෝ

සිද්ධි කළමනාකරණ සමාගමක හෝ MICE සංචාරක ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද සමග ඉංග්‍රීසි භාෂා හැකියාව.

**පාඨමාලා කාලසීමාව** : මාස 04

**පාඨමාලා ගාස්තුව** : රු. 40,000/- (වාරික 02 කින් ගෙවිය හැකියි)

**පාඨමාලා අන්තර්ගතය :**

| කඳුනැගීම් මාර්ගෝපදේශ පාඨමාලාවේ ඒකක |
|---|
| සාමාන්‍ය සංචාරක මොඩියුලය |
| කඳු නැගීම සඳහා සූදානම් කිරීම |
| කෙටි පැහැදිලි කිරීම |
| සෞඛ්‍ය සහ ආරක්ෂක විධි විධාන |
| සංචලන ක්‍රියාකාරකම් සිදු කිරීම |
| අවශ්‍ය උපකරණ හැසිරවීම |
| දිවිගලවා ගැනීමේ ශිල්ප ක්‍රම |
| අනතුරු ඉවත් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම |
| කඳු නැගීම අතරතුර කඳවුරු බැඳීම |

මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කොළඹ ප්‍රධාන ශාඛාවේ දී හා බණ්ඩාරවෙල හා මහනුවර ශාඛාවන් හී දී පැවැත්වේ.මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ සිසුන්ට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කරන බලපත්‍රය සඳහා යොමු කරන අතර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සුදුසුකම් සහතිකය සමග ජාතික වෘත්තීය සුදුසුකම් **NVQ4** මට්ටමේ සහතිකයද පිරිනමනු ලැබේ.

## ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව (CBT)

ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය (CBT) ශ්‍රී ලංකාවට නව සංකල්පයක් වන අතර, එය සාම්ප්‍රදායික සංචාරක ක්‍රමවේද වලින් පරිබාහිරව සංවර්ධනය වී ඇත. තවද එය සාම්ප්‍රදායික සංචාරක කර්මාන්තයට එරෙහිව විකල්ප සංචාරක වර්ගීකරණයක් ලෙසද සැලකිය හැක. විශේෂයෙන් ප්‍රජා මූලික සංචාරක කර්මාන්තයේ ප්‍රධාන සාධකයක් ලෙස ප්‍රජා හිමිකාරීත්වය සහ සංචාරක කර්මාන්තය සමග ඔවුන්ගේ සැලකිය යුතු මැදිහත්වීම දැක්විය හැක. ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව (CBT) සංචාරක කර්මාන්තය පිළිබඳ මාවතක් සහිත අද්විතීය ලක්ෂණ සමග සම්බන්ධ වී ඇති නායකයින් / ප්‍රජා මූලික සංවිධාන සාමාජිකයින් මූලික කරගෙන නිර්මාණය වී තිබේ. මෙම සය මාසික, පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන මගින් නායකයින් / ප්‍රජා මූලික සංවිධාන සාමාජිකයින් හට ඔවුන්ගේ ග්‍රාමීය පරිසර සඳහා විකල්ප ජීවනෝපාය ක්‍රමයක් ලබා ගැනීමට හැකියාවත් සහ දැනුම සහිත වටිනා අවස්ථාවක් සලසාදෙනු ඇත. තවද මෙමගින් සංචාරක කර්මාන්තය හරහා තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමටද රුකුලක් වනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය**

| |
|---|
| සංචාරක කර්මාන්තය පිළිබඳ හැඳින්වීම |
| ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය (CBT) පිළිබඳ හැඳින්වීම |
| ප්‍රජා මූලික සංචාරක නිෂ්පාදන සංවර්ධනය |
| ශ්‍රී ලාංකික අධ්‍යයනය |
| තිරසාර සංචාරක කර්මාන්තය |
| පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය |
| ප්‍රජා මූලික සංචාරක නායකයින් සඳහා ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා |

**ඇතුලත්වීමේ සුදුසුකම් :**

- අවම අධ්‍යාපනික සුදුසුකම් : අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබිය යුතුය.
- වයස් සීමාව : 18 - 65 දක්වා
- පළාත් සංචාරක අධිකාරිය මගින් පිළිගත් ප්‍රජා මූලික සංවිධානයක නායකයෙක් හෝ සාමාජිකයෙක් විය යුතුයි.
- අදාළ සුවිශේෂී හෝ සාම්ප්‍රදායික ජීවනෝපාය ක්‍රමයේ අවම වසර 05 ක පළපුරුද්ද
- වයඹ හෝ මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

**පාඨමාලා ගාස්තුව** : **ගාස්තු රහිතයි**

**කාල සීමාව** : **මාස 06**

**මහනුවර සහ කුරුණෑගල දී පාඨමාලා පැවැත්වේ.**

අමතන්න - අනුර අලහප්පෙරුම මයා - 0718108387
කරුණාකර ඔබේ අයදුම්පත්‍රය
ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, නො. 78, ගාලු පාර, කොළඹ 03
වෙත 2021 මාර්තු 20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ
ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් යොමු කරන්න. විමසීම් : 011-2208312-5

අමතන්න - ධීර හෙට්ටිආරච්චි මයා - 0718036633
කරුණාකර ඔබේ අයදුම්පත්‍රය
ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,
නො. 78, ගාලු පාර, කොළඹ 03
වෙත 2021 මාර්තු 20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ
ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.
විමසීම් : 011-2208312-5

**සියළු අයදුම් පත්‍ර - www.slithm.edu.lk මෙම වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය**